# SUGGESTED SOLUTIONS

## KE 5 – Commercial Insight for Management

සැප්තැම්බර් 2016

NOT FOR SALE

All Rights Reserved

# 1 වන කොටස

## පිළිතුරු 01

1.1

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 1.1.1 |
| නිවැරදි පිළිතුර | : C |

1.2

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 5.3.1 |
| නිවැරදි පිළිතුර | : A |

1.3

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 2.8.2 |
| නිවැරදි පිළිතුර | : A |

1.4

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 3.6.2 |
| නිවැරදි පිළිතුර | : B |

1.5

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 3.8.1 |
| නිවැරදි පිළිතුර | : B |

1.6

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 3.11.1 |
| නිවැරදි පිළිතුර | : B |

1.7

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 6.3.1 |
| නිවැරදි පිළිතුර | : D |

1.8

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 6.7.1 |
| නිවැරදි පිළිතුර | : C |

1.9

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 5.5.1 |
| නිවැරදි පිළිතුර | : B |

1.10

| | |
|---|---|
| ඉගෙනුම් ඵලය | : 6.15.1 |
| නිවැරදි පිළිතුර | : D |

(මුළු ලකුණු 20)

NOT FOR SALE


## <u>පිළිතුරු 02</u>

**2.1 ඉගෙනුම් ඵලය : 1.6.1**


- ව්‍යාපාර ඒකක, ව්‍යාපෘති, නිෂ්පාදිත සහ පාරිභෝගිකයන් පිළිබඳ වඩා ප්‍රයෝජනවත් තොරතුරු සැපයීම.
- නව ආයෝජනයන් උදෙසා ව්‍යාපාරික සිද්ධීන් සපයාදීම.
- ලබාදෙන තොරතුරු අවබෝධකර ගැනීම උදෙසා මෙහෙයුම් කළමණාකරුවන්ට සහාය වීම.
- උපාය මාර්ගික සැලසුම්කරණය හා අයවැය සකස් කිරීමෙහි ලා සහයෝගයෙන් ක්‍රියා කිරීම.
- මෙහෙයුම් කළමණාකරුවන්ට වඩාත් සහාය වන තොරතුරු පද්ධති නිර්මාණය කිරීම.

**2.2 ඉගෙනුම් ඵලය : 3.10.1**

පූර්ණ තරඟකාරී ආයතනයක ප්‍රධාන ලක්ෂණයක් වන නිදහස ප්‍රවේශ වීම් හා පිටවීම් නිසා සාමාන්‍ය ආදායම, සාමාන්‍ය පිරිවැයට වඩා වැඩි බැවින් කෙටි කාලයේදී ආයතන අතිප්‍රමාණික ලාභ උපයයි. (රූප සටහන 01) මෙම ලාභ නව ආයතන කර්මාන්තයට ආකර්ෂණය කරගන්නා අතර එමගින් මිල පහළ යයි. එනයින් ආයතන අලාභ ලැබීමට පටන් ගනියි. දිගුකාලයේදී, අලාභ ලැබීම හේතුවෙන් ආයතන විසින් කර්මාන්තය හැර යන අතර මිල ඉහළයාම ආරම්භ වේ. (රූප සටහන 02)





රූප සටහන 01




රූප සටහන 02

**2.3 ඉගෙනුම් ඵලය : 3.12.1**

ආන්තික පිරිවැය, ආන්තික ආදායමට සමාන වන විට හා අයකරන මිල (P1) සාමාන්‍ය ආදායමට සමාන වන විට ඒකාධිකාරය ($Q_1$) නිමවුම් මට්ටමේදී ලාභය උපරිම කරයි. $P_1$BCD සෘජුකෝණාශ්‍රය මගින් ඒකාධිකාරය විසින් උපයන අතප්‍රමාණික ලාභ පෙන්නුම් කරයි.




NOT FOR SALE

| 2.4 ඉගෙනුම් ඵලය : 4.3.1 |
|---|

(i) බදු, ඉතුරුම්, ආනයන වියදම්.

(ii)
- බදු, ආයෝජන අධෛර්යමත් කරන අතර ආර්ථික වර්ධනයට බාධා පමුණුවයි.
- ඉතුරුම් මගින් චක්‍රාකාර ප්‍රවාහය අඩුකරන අතර එමගින් සමාහාර ඉල්ලුම අඩුකරයි.
- ආනයන වියදම් රටක වියදම් ප්‍රවාහය වැඩිකරනු ලැබේ.

| 2.5 ඉගෙනුම් ඵලය : 4.5.2 |
|---|

- රජය මගින් විදේශ මුදල් සංචිතයන් වියදම් කිරීම හෝ පවත්වාගෙන යාම අවශ්‍ය නොවේ.
- ගෙවුම් ශේෂයේ හිඟයක් හෝ අතිරික්තයන් ස්වයංක්‍රීයව නිවැරදි වීමක් සිදුවේ.
- විනිමය අනුපාතයන් පවත්වාගෙන යාම සඳහා නොගැලපෙන ආර්ථික ප්‍රතිපත්තීන්, රජය විසින් තෝරා නොගත යුතුය.
- විනිමය අනුපාතයන් මගින් ආර්ථික තත්වයන් පැහැදිලි වන නිසා එමගින් සම්පත් බෙදාහැරීමේ කාර්යක්ෂමතාවය දිරිගැන්වීමක් සිදුවේ.

| 2.6 ඉගෙනුම් ඵලය : 4.8.1 |
|---|

- සෞඛ්‍ය හා ආහාර ගැටළු

  සමහරක් රටවල ආහාර හා සෞඛ්‍ය ආකල්ප/පුරුදු වල සැලකිය යුතු වෙනසක් දක්නට ලැබේ. සමහරක් පුද්ගලයින් සෞඛ්‍ය සම්පන්න ආහාර සඳහා ක්‍රමයෙන් හුරුවේ. මීට අමතරව, එළවළු පමණක් ආහාරයට ගැනීම සහ හරිත පරිභෝජනය ඉහළ ගොස් තිබේ. කාබනික ආහාර පිළිබඳ සැලකිල්ල මෙයට ඇතුලත් වේ.

- කාන්තාවන්ගේ සේවා නියුක්තිය.

  වැඩපළවල්වල කාන්තාවන්ගේ සහභාගිත්වය ඉහළයාම නිසා, අර්ධකාලීන සේවය සහ නම්‍යශීලි සේවය වෙත මාරුවීමේ උපනතියක් දක්නට ඇත.

- පරිසර නැඹුරුතාවය

  පාරිසරික ස්ථායිතාවය සහ ආරක්ෂාව සම්බන්ධයෙන් වර්ධනය වෙමින් පවතින සැලකිලිමත්භාවයෙහි ප්‍රතිඵලයක් වශයෙන්, ව්‍යාපාර ආයතන, වඩාත් පරිසර හිතකාමී ව්‍යාපාර භාවිතයන් වෙත ගමන් කරමින් පවතී.

NOT FOR SALE

| 2.7 ඉගෙනුම් ඵලය : 4.10.1 |
|---|

- විදුලි සංදේශනය සහ ගුවන් ප්‍රවාහනය ඇතුළත්ව ලොව පුරා සන්නිවේදනය දියුණු කිරීම.
- ජාතීන් විසින් වෙළදාමේ වාසි ලබාගැනීම උදෙසා වර්ජන හැසිරීම් රටාවලින් ඉවත්වීම හේතුවෙන්, රට රටවල් අතර පැවති වෙළඳ බාධා ඉවත්වීම.
- දේශපාලනික වශයෙන් සිදුවූ වෙනස්කම් හේතුවෙන් ගෝත්‍රික හෝ රාජ්‍ය සැලසුම්ගත ආර්ථික වලින් මිදී වෙළඳපල ක්‍රමවේදයන්ට මාරුවීම.
- තරඟකාරීත්වය ඉහළයාම.
- නව වෙළඳපොලවල් වර්ධනය
- ජාතීන් අතර ව්‍යාපාර සන්ධාන සහ සම්බන්ධතා

| 2.8 ඉගෙනුම් ඵලය : 6.5.1 |
|---|

- තොග වශයෙන් මිලදී ගැනීමේදී හිමිවන වට්ටම් තුළින් අමුද්‍රව්‍ය පිරිවැය අඩුකර ගැනීම.
- තොග පවත්වාගැනීම වඩාත් කාර්යක්ෂම වීම.
- තොග වශයෙන් විකිණීම සිදුකරනු ලබන නිසා මහා පරිමාන ආයතනයකට බෙදාහැරීමේ පිරිවැයේ හා ප්‍රචාරණ පිරිවැයේ සාපේක්ෂ ඉතිරිකරගැනීම් අත්කර ගත හැක.
- විශාල පරාසයකට අයත් භාණ්ඩ ඉදිරිපත් කිරීමෙන්, ක්ෂේත්‍ර බද්ධ ප්‍රතිලාභ අත්කරගත හැක.

| 2.9 ඉගෙනුම් ඵලය : 6.13.1 |
|---|

ආදේශන ප්‍රතිවිපාකය.
මෙහිදී වැටුප් අනුපාතයේ වැඩිවීම, විවේකයේ ආවස්ථික පිරිවැය වැඩිකරන අතර, ඒ අනුව, වැඩ නොකර සිටින පැය ගණනට විශාල ආදායමක්ද කැප කිරීමට සිදුවේ. එසේ වන්නේ, පැයක් වැඩ නොකර සිටීමෙන් ශ්‍රමිකයාට අහිමිවන මුදල් වඩා වැඩි එකක් වන හෙයිනි. ආදේශන ප්‍රතිවිපාකය මගින් පුද්ගලයන් විවේකය වෙනුවට වැඩ කිරීම ආදේශනය කිරීම සඳහා යොමුකරයි.

| 2.10 ඉගෙනුම් ඵලය : 6.14 |
|---|

- ගනුදෙනු සටහන් කිරීම. -එක් එක් ව්‍යාපාරික ගනදෙනු සහ සිද්ධීන් පිළිබඳ තොරතුරු සටහන් කිරීම සඳහා තොරතුරු පද්ධති සහාය වේ.
- තීරණ ගැනීම - සාර්ථක තීරණ ගැනීම සඳහා තොරතුරු පද්ධති උපකාරී වේ.
- සැලසුම්කරණය- තොරතුරු පද්ධති මගින් විවිධ වූ සැලසුම්කරණ උපකරණ භාවිතයට ඉඩ සලස්වයි.
- කාර්යඵල මැනීම - දත්ත රැස්කිරීම, විශ්ලේෂණය කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා තොරතුරු පද්ධති ප්‍රයෝජනවත් වන අතර, එම තොරතුරු කාර්යඵල මැනීම සඳහා භාවිතා කළ හැක.
- පාලනය - තොරතුරු පද්ධති, සැලසුම්වල ප්‍රතිඵලයක් අධීක්ෂණයට සහ පාලනයට භාවිතා කළ හැක.

**(3 x 10 = (මුළු ලකුණු 30)**

NOT FOR SALE

# 2 වන කොටස

## පිළිතුර 03

| ඉගෙනුම් ඵලය : 2.7 / 2.9 |
|---|

(a) (i) හිඟකම - සත්‍ය වශයෙන්ම නිපදවිය හැකි ප්‍රමාණයට වඩා මිනිස් අවශ්‍යතා පැවතීම.

(ii) ආවස්ථික පිරිවැය යනුවෙන් අදහස් කරන්නේ, තීරණයක් ගනු ලබන විට අත්හරිනු ලබන හොඳම විකල්පයේ ප්‍රතිලාභ හෝ අභිමිවන ප්‍රතිලාභයන්ය.

(iii) ආර්ථික ලාභ හෝ පාඩු යනු නිමැවුමක් විකිණීමෙන් ලැබූ ආදායම සහ භාවිතා කළ යෙදවුම් වල ආවස්ථික පිරිවැය අතර වෙනසයි.

(b) හිඟකම පවතින විට ආයෝජනයෙන් උපරිම ලාභ ලැබීම සඳහා, තීරණ ගන්නා විසින් තමාව ආයෝජනයේ මූල්‍ය ලාභය පමණක් සීමා නොකළ යුතු අතර ආයෝජනයේ ආවස්ථික පිරිවැය කෙරෙහිද අවධානය යොමුකළ යුතුය. එනම් තීරණයක් ගනු ලබන විට අත්හරිනු ලැබූ හොඳම විකල්පයේ ප්‍රතිලාභ/අභිමිවන ප්‍රතිලාභයන්ය. එසේ කිරීමේදී ආයෝජනය සඳහා වෙන් කරන ලද සම්පත් වල හිඟකම පිළිබඳ අවධානය යොමුකරමින් ආයෝජකයා විසින් ආයෝජනයේ ආර්ථික ලාභ සොයා දැනගත යුතුව තිබුණි. ඒ අනුව ළඟාකරගත් ශුද්ධ ප්‍රතිලාභය මගින් ඔහු/ඇය විසින් ආයෝජනයෙන් ලබාගන්නා සත්‍ය ප්‍රතිලාභය පෙන්නුම් කෙරේ.

(c) ආර්ථික ලාභය = ආදායම - (ප්‍රත්‍යක්ෂ පිරිවැය + ව්‍යාංග පිරිවැය)

| | **A** ව්‍යාපෘතිය | **B** ව්‍යාපෘතිය |
|---|---|---|
| මූලික ප්‍රාග්ධනය | 10,000,000 | 15,000,000 |
| වාර්ෂික ප්‍රතිලාභ අනුපාතිකය | 15% | 18% |
| ආදායම | **1,500,000** | **2,700,000** |
| | | |
| අතිරේක ප්‍රාග්ධනය | - | 5,000,000 |
| පොලී අනුපාතය | - | 22% |
| ප්‍රත්‍යක්ෂ පිරිවැය | - | 1,100,000 |
| ගිණුම්කරණ ලාභය | **1,500,000** | **1,600,000** |
| ව්‍යාංග පිරිවැය | 1,600,000 | 1,500,000 |
| ආර්ථික ලාභය | (100,000) | 100,000 |

∴ **B** ව්‍යාපෘතිය වඩාත් වාසිදායක වේ.

**(ලකුණු 10)**

NOT FOR SALE

## පිළිතුර 04

| ඉගෙනුම් ඵලය : 4.4 / 4.6.2 |
|---|

(a) ඉල්ලුමෙන් ඇදුණු උද්ධමනයක් හටගන්නේ ආර්ථිකයේ ඵලදායී ධාරිතාවය ඉක්මවා යන (එනම් සමාහාර සැපයුම) සමාහාර ඉල්ලුම නිසා ඇතිවන අතිරික්තයකිනි.

උදාහරණ : පාරිභෝගිකයන්ගේ ඉහළ ආදායම් මට්ටම්, ඉහළ රාජ්‍ය වියදම්, අපනයන සඳහා වන ඉහළ ඉල්ලුම ආදිය හේතුකොට ගෙන සමාහාර ඉල්ලුමේ ඇතිවන වර්ධනයක්

භාණ්ඩ හා සේවාවන් වල නිෂ්පාදන පිරිවැය ඉහළයාමක් නිසා පිරිවැයෙන තල්ලු වූ උද්ධමනය ඇතිවන අතර එය සමාහාර සැපයුමෙහි අඩුවීමකට හේතු වේ.

උදාහරණ : විනිමය අනුපාතයේ අවප්‍රමාණය වීමක් නිසා ඇතිවිය හැකි ආනයනික අමුද්‍රව්‍ය මිල ඉහළයාම, ඉහළ වේතන අනුපාත ආදිය.

(b) රටෙහි උද්ධමන අනුපාතය එහි තරගකාර රටවලට වඩා ඉහළ අගයක් ගනිනම්, එහි අපනයන සාපේක්ෂ වශයෙන් මිල අධික වනු ඇති අතර, ආනයන සාපේක්ෂ වශයෙන් ලාභ වනු ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් අපනයන සඳහා වන ඉල්ලුම පහළ යනු ඇති අතර ආනයන සඳහා වන ඉල්ලුම ඉහළ යනු ඇත. එම නිසා එය රටෙහි ගෙවුම් ශේෂය කෙරෙහි සෘණාත්මක ලෙස බලපානු ඇත.

(c)
- ඉහළ බදු හා රාජ්‍ය වියදම් අඩු කිරීම මගින් පිස්කල් ප්‍රතිපත්තිය සංකෝචනය කිරීම.
- පොලී අනුපාත වැඩි කිරීම හෝ මුදල් සැපයුම අඩු කිරීම මගින් මූල්‍ය ප්‍රතිපත්තිය සංකෝචනය කිරීම.

**(ලකුණු 10)**

NOT FOR SALE

## පිළිතුර 05

| ඉගෙනුම් ඵලය : 5.4 |
| --- |

(a)

- ව්‍යවසායකත්වය - ව්‍යාපාර අවස්ථා හඳුනාගැනීමේ හැකියාව හා ඒ මත සම්පත් යෙදවීම තුලින්, අපේක්ෂිත ප්‍රතිලාභ ලබාගැනීම.
- අන්තර් පුද්ගල කුසලතා - ජාලකරණය, සුහදබව ගොඩනගා ගැනීම, බලපෑම් කිරීම, කේවෙල් කිරීම, ගැටළු නිරාකරණය, සවන්දීම, උපදේශනය, පුහුණු කිරීම සහ ධනාත්මක සන්නිවේදනය ආදිය මෙයට ඇතුලත්ය.
- විශාල දැකමක්ද සහිත තීරණ ගැනීමේ හා ගැටළු නිරාකරණය කිරීමේ කුසලතා.
- කාල කළමණාකරණය හා පෞද්ගලික සංවිධානය.
- ස්වයං සංවර්ධන කුසලතා - අත්දැකීම් තුලින් අඛණ්ඩව ඉගෙනගැනීමේ හැකියාව, සහ එමගින් ස්වයං දැනුවත් වීම වර්ධනය කර ගැනීම සහ තවදුරටත් පවත්නා ඉඩ ප්‍රස්ථා වල ප්‍රතිලාභ උකහාගැනිම තුලින් ස්වයං සංවර්ධනය ඇතිකර ගැනීම.

(b) "උපතින් නායකයකු වනවා මිස ඔවුන් තැනිය නොහැක" යන්න ගති ලක්ෂණ න්‍යායන්හි මූලික මූලධර්මය වන අතර එමගින් දක්වන ආකාරයට සමහර පෞද්ගලික ගතිලක්ෂණ සාර්ථක නායකයන්ට පොදු ඒවා වේ.

කෙසේ වෙතත්, පහත දැක්වෙන හේතුන් නිසාවෙන් මෙම න්‍යාය අඩු වැඩි වශයෙන් අපකීර්තියට පත් ව ඇත.

- නායකයන්ගේ සාර්ථකත්වය නායකයාගේ හැසිරීම මතද (ශෛලීය න්‍යායන්), එමෙන්ම අවස්ථාව මතද (අසම්භාව්‍ය න්‍යායන්) රදා පවතී.
- ඵලදායී නායකත්වය උදෙසා සමහර ගතිලක්ෂණ අනිවාර්යයෙන්ම අවශ්‍යවන බවට වන උපකල්පන කිසිදා සනාථ වී නොමැත.
- නායකයන් සඳහා යෝජිත ගතිලක්ෂණ ලැයිස්තු අතිවිශාල, විවිධාකාර හා පරස්පර විරෝධී ඒවාවේ.
- නායකත්ව අවස්ථාවෙහි පවත්නා සංකීර්ණත්වය, ගතිලක්ෂණ න්‍යාය තුලින් නොසලකා හරින අතරම නායකත්ව ගති ලක්ෂණ සහිත සියල්ලම හොඳ නායකයන් බවට පත්වීමද සිදු නොවේ.

(ලකුණු 10)

NOT FOR SALE

## පිළිතුර 06

ඉගෙනුම් ඵලය : 6.11

(a) අනෙකුත් සන්නම් හෝ භාණ්ඩ වලට සාපේක්ෂව පාරිභෝගිකයන් විසින් තම සන්නම හෝ භාණ්ඩය දකින ආකාරය වෙළඳපොළ ස්ථාපනය ලෙස හඳුන්වයි.

(b)

- ස්ටාර් කෝලා, ගුණාත්මකභාවය සහ අධි මිල ස්ථාපන විචල්‍යයයන් ලෙස භාවිතා කරයි.
- ලයිට් කෝලා, අවම මිල, ස්ථාපන විචල්‍ය ලෙස භාවිතා කරයි.

(c)

- ප්‍රචාරණ - ඔවුන්ගේ භාණ්ඩ ප්‍රවර්ධනය කිරීම සඳහා පොදු මාධ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීම.
- විකුණුම් ප්‍රවර්ධනය - ඔවුන්ට එක්තරා කාල සීමාවක් සඳහා මිල ප්‍රවර්ධනය වැඩ සටහන් ආදිය යොදාගත හැක/ තරඟ සංවිධානය කිරීම, විකුණුම් ඉහළ නැංවීම සඳහා පක්ෂපාතී පෙළඹවීම්. (loyalty incentives)
- මහජන සම්බන්ධතා - සංවිධානය හා මහජනතාව අතර අන්‍යෝන්‍ය අවබෝධය සහ කීර්තිනාමය ප්‍රවර්ධනයට මෙය හේතුවන අතර එමගින් ප්‍රසිද්ධිය (Publicity) ප්‍රවර්ධනය වන අතර විකුණුම් ඉහළ යයි.
- සෘජු අලෙවිකරණය - විකුණුම් ඉහළ නැංවීමට, පාරිභෝගිකයන් සහ සමාගම/ආයතනය අතර සෘජු සම්බන්ධතාවයක් මෙමගින් ඇති කරයි.

(ලකුණු 10)

NOT FOR SALE

NOT FOR SALE

## <u>3 වන කොටස</u>

### <u>පිළිතුර 07</u>

| |
|---|
| ඉගෙනුම් ඵලය : 3.5 / 3.7 |

(a) $P(d) = 160 - 0.625\ Q$

$P(s) = 5 + 0.250\ Q$

සමතුලිත ලක්ෂයේදී Pd = Ps

සමතුලිත ලක්ෂයේදී ප්‍රමාණය (Eq) = 160 - 0.625Q = 5 + 0.250Q

155 = 0.875 Q


Q = <u>177.14 (බැරල් මිලියන)</u>

P (වෙළඳපල සමතුලිතයේදී මිල) : (ඉල්ලුම් හෝ සැපයුම් ශ්‍රිතය යන දෙකෙන් එකක් සඳහා "Q" වටිනාකම ආදේශ කිරීමෙන් ) :

P = 160 - 0.625 (177.14) = ඇ. ඩොලර් 49.28

(b) (i) පහලට බෑවුම් වන ඉල්ලුම් වක්‍රයක් යටතේ, යම් ඒකක ගණනක් සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමති මුළු ඒකක ගණනක් සඳහා පාරිභෝගිකයා ගෙවීමට කැමති මුළු වටිනාකම/මිල සහ එම ඒකක ප්‍රමාණයම සඳහා සත්‍ය වශයෙන්ම ගෙවූ මුළු වටිනාකම අතර හැමවිටම පරතරයක් පවතී.

එක් එක් පාරිභෝගිකයන් විසින් පාරිභෝජනයෙන් ලබන ආන්තික උපයෝගීතාවය විවිධාකාර වේ. පාරිභෝගිකයන් ගෙවීමට සූදානම් මිලට වඩා අඩු මිලකදී වෙළඳපල මිලට භාණ්ඩ මිලට ගැනීමට පාරිභෝගිකයන්ට හැකි වනු ඇත. මෙම අවස්ථාව පාරිභෝගික අතිරික්තය ලෙස හඳුන්වයි.




පාරිභෝගික අතිරික්තයක් පැවතීමට හේතුව වන්නේ වෙළඳපල මිල සහ ඉල්ලුම් ප්‍රමාණය යන දෙක අතර වෙනස්වන සම්බන්ධතාවයක් පැවතීමයි. මෙම වෙනස්වන සම්බන්ධතාවය දැකිය හැකි වනු ඇත්තේ ඒකාධිකාරයකදී මෙන් ඉල්ලුම් වක්‍රයේ පහළට බෑවුම් වීමක් සම්බන්ධයෙන් පමණි. (එනම් බින්දුව හා අනන්තය අතර මිල ඉල්ලුම් නම්‍යතාවයක් ඇති ඉල්ලුම් වක්‍රයක් ඇති විට).


(b) (ii) පාර්භෝගික අතිරික්තය

= (ඇ. ඩො. 160.00 - 49.28) x (177.14)/2

= ඇ. ඩො. මිලියන 9,806.47

(c)

- ගෝලීය ආර්ථික වර්ධනයේ පහළ යැමක්, පාර්භෝගිකයන්ගේ ආදායම් මට්ටම් වල පහළ යාමකට මූලිකවේ. මෙමඟින් අනෙක් අතට බොර තෙල් පාර්භෝජනය අඩු කළ හැක.
- දෙමුහුම් කාර් වැනි වඩා ඉන්ධන පිරිමැසුම් වාහන හඳුන්වාදීම, බොරතෙල් භාවිතය අඩුවීමකට හේතු වේ.




තෙල් සංචිත සම්බන්ධයෙන් ඉහළ පර්යේෂණ කිරීම් නිසාවෙන්, සැපයුම් වක්‍රය $S_1$ සිට $S_2$ දක්වා විතැන් කරමින් බොරතෙල් සැපයුමෙහි ඉහළ යාමක් ඇතිවනු ඇත.

එහි ප්‍රතිඵලයක් වශයෙන් සමතුලිත ප්‍රමාණය $Q_1$සිට $Q_2$ දක්වා ඉහළ යන අතර සමතුලිත මිල $P_1$සිට $P_2$ දක්වා පහළ යයි.

(e) (i) **ඉන්ධන සඳහා වන දේශීය සිල්ලර විකුණුම් මිල දිගටම නොවෙනස්ව පවතින්නේ නම්,**

ලෝක වෙළඳපල මිල ඉහළයාම නිසාවෙන්, ආනයන පිරිවැය සහ අපනයන ඉපයුම් අතර දැනට පවතින අවාසිදායක පරතරය පුළුල් කරමින් ඉන්ධන ආනයන පිරිවැය ඉහළ යනු ඇත. රටෙහි ගෙවුම් ශේෂ ප්‍රශ්නය කෙරෙහි විශාල පීඩනයක් ඇති කරනු ඇත.

ඉහළ ඉන්ධන ආනයන පිරිවැය පියවීම සඳහා ඇමරිකන් ඩොලර් සඳහා ඇති ඉල්ලුම ඉහළ යන නිසාවෙන්, ශ්‍රී ලංකා රුපියලෙහි බාහිර අගය මත පීඩනයක් ඇති වනු ඇත.

තෙල් සඳහා වන සිල්ලර මිල නොවෙනස්ව පැවතීම නිසා මූලික වශයෙන්, පාර්භෝගික මිල දර්ශකය / උද්ධමනයට කිසිදු බලපෑමක් ඇති නොවනු ඇත.

NOT FOR SALE

(ii) **ලෝක වෙළඳපලෙහි බොරතෙල් මිලෙහි ඇතිවිය හැකි වෙනස්කම් මත රඳා පවතිමින් රජය විසින් තෙල් සඳහා වන දේශීය සිල්ලර මිල ගලපනු ලබන්නේ නම්,**

ඒකකයක් ආනයනය කිරීමේ පිරිවැයෙහි ඉහළ යාම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ තෙල්/ඉන්ධන ආනයන වියදම ඉහළ යනු ඇත. කෙසේ නමුත් මෙමගින් වන සිල්ලර විකුණුම් මිල ඉහළයාමේ ගැලපුම නිසා , බොරතෙල් මිල ඉහළ යාමේ මුළු ප්‍රමාණයෙන් කොටසක්, දේශීය පාරිභෝගිකයා විසින් උකහාගැනීමට සිදුවනු ඇත. ඒකක ආනයන පිරිවැයෙහි මුළු ඉහළයාම පාරිභෝගිකයා මත පැවරුවේ නම්, ඒකකයක් සඳහා වන වක්‍ර බද්ද නොවනස්ව පවතිනු ඇති නමුත් මුළු වක්‍ර බදු ආදායම අඩුවීමට හේතු කාරක වෙමින් සිල්ලර මිල ඉහළයාම නිසාවෙන් අවම වශයෙන් කෙටිකාලයේදී දේශීය ඉන්ධන පරිභෝජනය පහළයාමට හැකියාවක් පවතිනු ඇත. එම නිසා මුළු වක්‍ර බදු ආදායම මත ඇති වන අවසාන බලපෑම රඳා පවතිනු ඇත්තේ සිදුකරන ලද සිල්ලර මිල ගැලපුමේ ප්‍රමාණය සහ ඉන්ධන මිල ඉහළයාම කෙරෙහි දේශීය පාරිභෝගිකයා ප්‍රතිචාර දක්වනු ඇති ආකාරය අනුවය.

ආනයන පිරිවැය ඉහළයාමට මුහුණදීම සඳහා ඉන්ධන සඳහා වන දේශීය සිල්ලර මිල නොවෙනස්ව පවතිනු ඇති නිසාවෙන්, පොදු හා පෞද්ගලික ප්‍රවාහන පිරිවැය, විදුලි උත්පාදනය, නිෂ්පාදනය ආදියට අදාලව ඉන්ධන පරිභෝජන පිරිවැයෙහි සංගත ඉහළයාමක් ඇතිවනු ඇත.

එළවළු වැනි පාරිභෝගික භාණ්ඩවල නිෂ්පාදන පිරිවැය සහ ප්‍රවාහන පිරිවැය නියත වශයෙන්ම ඉහළ යනු ඇති අතර පාරිභෝගික මිල දර්ශකයට අයහපත් ආකාරයට බලපෑම් කරමින් ඇති විය හැකි දම්වැල් බැලපෑම (Chain effect) නිසාවෙන්, පිරිවැයෙන් තල්ලු වූ උද්ධමනය හටගනී.

**(මුළු ලකුණු 20)**

NOT FOR SALE

THE INSTITUTE OF CHARTERED ACCOUNTANTS OF SRI LANKA

# නිවේදනය

මෙහි ලබාදුන් පිළතුරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් (ශ්‍රී ලංකා ව.ග.) පමණක් ලබාදෙන ලද අතර, එම පිළිතුරු ඔබ විසින් එය "එසේම~" යන පදනම මත පිළිගත යුතු වේ.

එම පිළිතුරු "ආදර්ශ පිළිතුරු~" ලෙස අදහස් නොකරන නමුත් ඒවා බොහෝදුරට suggested solution ලෙස දක්වේ.

පිළිතුරු වලින් පධාන අරමුණු දෙකක් ඉටුකෙරේ. ඒවා නම්,

01. විභාග ප්‍රශ්නයකට යෝජිත විසඳුමක් සඳහා සවිස්තරාත්මක නිදසුනක් (උදාහරණයක්) සැපයීම සහ,

02. ශිෂ්‍යයන්ට විෂය පිළිබඳව තොරතුරු පර්යේෂණය කිරීම සඳහා අත්වැලක් සැපයීම සහ විෂය පිළිබඳව ඔවුන්ගේ අවබෝධය සහ අගය වර්ධනය කිරීම.

    මෙම යෝජිත විසඳුම් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) කිසිඳු ප්‍රතිඥාභාරයක් ලබා නොදෙන නිසා ඒ සම්බන්ධව කිසිඳු අගතියකට පත්වීමක් පිළිබඳව මැසිවිල්ලක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ඉදිරිපත් කිරීමට ඔබ හට හේතුවක් නොමැත. ඒ කෙසේ වෙතත් ඔබ විසින් යම් නඩුකරයක්, වන්දි ඉල්ලීමක්, පෙත්සමක්, තර්ජනය කිරීමක් හෝ බලවත් ඉල්ලීමක් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) එරෙහිව ගොනුකරනු ලැබ එයින් සැලකියයුතු අන්දමේ ජයග්‍රහණයක් ලබා නොගතහොත් ඔබ විසින් එම නඩුකරයට අදාළ සම්පූර්ණ නෛතික ගාස්තු සහ වියදම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතු වේ. එනයින්ම මෙම අයිතිවාසිකම හෝ මෙහි විස්තර කෙරෙන හෝ ශ්‍රී ලංකාවේ නීතීන් යටතේ හිමි වෙනත් අයිතිවාසිකම් බලාත්මක කරවා ගැනීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) නෛතික ක්‍රියාමාර්ගයකට යොමුවීමට සිදුවුවහොත්, ඊට අදාළ නෛතික ගාස්තු සහ වියදම්ද ඔබ විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයට (ශ්‍රී ලංකා ව.ග.) ගෙවිය යුතුවේ.

---


2 2013 ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (ශ්‍රී ලංකා ව.ග.) මගිනි.
සියළුම හිමිකම් ඇවිරිණි.

**මෙම ලේඛණයේ කිසිම සටහනක් ප්‍රතිඋත්පාදනය කිරීම, කුමන හෝ ආකාරයකින් හෝ ක්‍රමයකින් එනම්, ඉලෙක්ට්‍රොනික, යාන්ත්‍රික, ඡායා පිටපත් කිරීම, වාර්තාගත කිරීම හෝ වෙනත් ක්‍රමයකින් සම්ප්‍රේෂණය කිරීම ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ශ්‍රී ලංකා ව.ග.) පූර්ව ලිඛිත අවසරයකින් තොරව සිදු නොකළ යුතුය.**


NOT FOR SALE